**සමාජ ආරක්ෂණ දැල් ව්‍යාපෘතිය (වැඩසටහන 01 සහ 02) - 2017**

-----------------------------------------------------------------------

සමාජ ආරක්ෂණ දැල් ව්‍යාපෘතියේ (සංරචක 01 හා 02) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 දෙසැම්බර් 28 දින එළඹි අංක 5915 - එල්කේ දරන ණය ගිවිසුමේ (II) බී (3) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාව තුළ දුප්පත් සහ අවදානම් සහිත කණ්ඩායම්වලට ප්‍රතිලාභ ලැබෙන සමාජ ආරක්ෂණ දැල් වැඩ සටහන්වල සමානාත්මතාව, කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා දායකවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපාතියේ කාර්යයන් සංරචක 03 කින් සමන්විත වන අතර, ව්‍යාපෘතියේ මෙහෙයුම් අත්පොතේ 4.2.3 පරිච්ඡේදයේ අවශ්‍යතාවය මත ව්‍යාපෘතියේ සංරචක 01 හා 02 හි කාර්යසාධනය වෙනම දැක්වීම සඳහා මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,212 කට සමාන ඇ.එ.ජ. ඩොලර් මිලියන 75 ක් වන අතර ජාත්‍යන්තර සංවර්ධන සංගමය සම්පූර්ණ මුදල ලබාදීමට එකඟ වී ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කර 2022 මාර්තු 30 දින අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා හා පොත්පත්වල විශේෂ (ඩොලර්) ගිණුමට කරන ලද මූලික තැන්පතු සහ ගිණුමෙන් කරන ලද 2017 දෙසැම්බර් 31 එම ගිණුමේ ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සංසන්දනය කර තිබුණේද යන බව

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(එ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා හා පොත්වල විශේෂ (ඩොලර්) ගිණුමට කරන ලද මූලික තැන්පතු හා ගිණුමෙන් කරන ලද ආපසු ගැනීම් සත්‍ය හා සාධාරණ ලෙස

හෙළිදරව් කර තිබුණු බව හා 2017 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සංසන්දනය කර තිබුණු බව,

(ඇ) ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත්වලට සහයෝගය දෙන පරිදි ණය ගිවිසුමේ සඳහන් විශේෂ අවශ්‍යතාවලට සුදුසු පරිදි වියදම් ප්‍රකාශ සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇති බව,

(ඉ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | 2017 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | යූරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන |
| අයිඩීඒ | 75.00 | 11,212.50 | 1,351.75 | 2.54 | 389.02 |
| එකතුව | 75.00 | 11,212.50 | 1,351.75 | 2.54 | 389.02 |

### 3.2 භෞතික ප්‍රගතිය

ඉහත දැක්වූ පරිදි, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සංරචක 03 ක් යටතේ කරගෙන යන ලද අතර ඉන් සංරචක 01 හා 02 යටතේ වූ උපයෝජන සම්බන්ධතා දර්ශකය, සේවා සැපයීම ඒකාබද්ධ කිරීම හා ඒකාබද්ධ සමාජ ලේඛනාධිකාරයක් ගොඩනැගීම යනාදී කාර්යයන්ගෙන් සමන්විත වී තිබුණි. ඉහත කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියේදී පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, 2002 අංක 24 දරන සුභසාධක ප්‍රතිලාභ පනත යටතේ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවන ලද අතර, 2016 අගෝස්තු 20 දින සිට එය ක්‍රියාත්මක වන අතර මේ නිසා උපයෝජන සම්බන්ධතා දර්ශකය යටතේ වූ ඉලක්ක ව්‍යාපෘතිය කාර්යයන් ආරම්භ කිරීමට ප්‍රථම ලඟාකර ගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ උපයෝජන සම්බන්ධ දර්ශක - 02 අනුව සමාලෝචිත වර්ෂය තුල සුදුසුකම් සපුරා ඇති කාර්ය මණ්ඩලයක් සහිතව සමාජ ලේඛනාධිකාරී අංශයක් හා සමාජ ලේඛනාධිකාරී තොරතුරු පද්ධතියක් පිහිටුවීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති අධ්‍යක්ෂක කරන ලද පැහැදිලි කිරීම් අනුව සමාජ ලේඛනාධිකාරී

තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් ආයතනයක් තෝරාගැනීමට පමාවීම නිසා උපයෝජන සම්බන්ධතා දර්ශක - 02 යටතේ අදාල වූ කාර්යයන් ක්‍රියාත්මක කිරීම ලඟාකර ගැනීමට නොහැකි විය. මේ නිසා, සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතියේ උපයෝජන සම්බන්ධතා දර්ශක - 02 යටතේ වෙන්කර තිබූ රු.මිලියන 778.24 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 05 ක මුදල උපයෝජනය කිරීමට නොහැකි විය.

(ඇ) ව්‍යාපෘති ඇගැයීම් ලේඛනය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ 4.41 පරිච්ඡේදය අනුව උපයෝජන සම්බන්ධතා දර්ශක ප්‍රගතිය තහවුරු කර ගැනීම සඳහා සුදුසුකම් හා පළපුරුද්ද සහිත ස්වාධීන තුන්වන පාර්ශවයක් මගින් සිදුකල යුතුව තිබුණි. තවද, තහවුරු කර ගැනීමේ කාර්යය අධීක්ෂණය කිරීම සඳහා මෙම තුන්වන පාර්ශවය තක්සේරු වාර්තාව ව්‍යාපාති කළමනාකරණ අංශය විසින් ලබාගෙන ව්‍යාපෘති කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල යුතුය. කෙසේ වුවද, ඉහත කාර්යය සඳහා ව්‍යාපෘතිය තුන්වන පාර්ශවය ආයතනයක් තෝරා ගැනීම සහ පත් කිරීම සඳහා පිවර ගෙන නොතිබුණි.